# ඡායා රූ පිළිසඳර

2010 ජනවාරි /පෙබරවාරි

ශ්‍රී ලංකා ජාතික ඡායාරූප කලා සංගමයේ අධ්‍යාපන හා තොරතුරු ප්‍රකාශනය

**Educational and News Bulletin of The National Photographic Art Soceity of Sri Lanka**


## සුබ නව වසරකට ආසිරි..





### අර්ධ වාර්ෂික මහා සභා රැස්වීම.

සංගමයේ 2009/2010 අර්ධ වාර්ෂික මහා සභා රැස්විම 2010 ජනවාරි මස 31 වැනි දින සංගමයේ ජාතික ඡායාරූප ශිල්ප මධ්‍යස්ථානයේ දී පැවැත්විණි.

### ඩිප්ලෝමා නිබන්ධන භාර ගැනීම

2009 අධ්‍යයන වර්ෂයේ ඡායාරූප ශිල්ප ඩිප්ලෝමා පරීක්ෂණයට ඉදිරිපත් වූ විද්‍යාර්ථීන්ගේ නිබන්ධන භාර ගන්නා අවසන් දිනය මාර්තු මස 31 වේ. මෙම කාර්යය භාරව කටයුතු කරන රවීන්ද්‍ර ප්‍රියන්ත ලාල් (0717578989/0777578989) මහතාගෙන් වැඩිදුර උපදෙස් ලබාගෙන අදාළ දිනට පෙර නියමිත නිබන්ධනය භාරදෙන මෙන් විද්‍යාර්ථීන් වෙත මෙයින් දන්වා සිටිනු ලැබේ.

### නවක සාමාජික භවතුන් සෙනෙහසින් පිළිගනිමු

2010 වසර සඳහා ශ්‍රී ලංකා ජාතික ඡායාරූප කලා සංගමයේ සාමාජිකත්වය ලබා සිටින නවක සාමජික භවතුන් ගරු අධ්‍යක්ෂ මණ්ඩලය ඇතුළු සමස්ත සාමාජිකත්වය ඉමහත් සෙනෙහසින් පිළිගනු ලැබේ. තමන්ට මෙන් ම සංගමයට ද, දේශීය ඡායාරූප කලාවට ද සුවිශාල මෙහෙවරක් ඉටු කරමින් මෙම ක්ෂේත්‍රයේ දීර්ඝ ඉදිරි ගමනකට නවක සැම වෙත ශුභාශිංසන පිරිනැමේ.

### නව වසරේ පංති පෙබ. 14 සිට

නව වසර සඳහා පංති ආරම්භය 2010 පෙබරවාරි මස 14 වැනි දින සිදු කෙරේ. සුපුරුදු පරිදි ෆොස්ටර් පටුමගේ පිහිටි මහා බෝධි විද්‍යාලයේ ඉරු දින ප. ව. 1. 30 සිට 4. 30 දක්වා පංති පැවැත්වේ. පංති පැවැත්විම සහ චාරිකා පිළිබඳ වැඩිදුර විස්තර ගරු අධ්‍යාපන අධ්‍යක්ෂතුමාගෙන් හෝ පංති භාර උපදේශකවරුන්ගෙන් ලබාගත හැකි ය.

### ප්‍රභාලේඛිකාවන්ගේ තෙවන අනාවරණය

අප සංගමය හා සම්බන්ධ ලංකා ප්‍රභාලේඛිකා සංසදය ජාත්‍යන්තර කාන්තා දිනය අරමුණු කොටගෙන සංවිධානය කරනු ලබන තෙවන වාර්ෂික ඡායාරූප ප්‍රදර්ශනය 2010 මාර්තු මස 06, 07 හා 08 දිනවල කොළඹ ජාතික කලාභවනේ දී පැවැත්වීමට කටයුතු සූදානම් කර ඇත.

වර්ණ සහ කලු සුදු දෙඅංශය යටතේ ලක්දිව පුරවැසිභාවය ඇති ඕනෑ ම කාන්තාවකට මේ සඳහා නිර්මාණ ඉදිරිපත් කළ හැකි වේ. කෘති භාරගන්නා අවසන් දිනය පෙබරවාරි 18 තෙක් දීර්ඝ කොට ඇත. යමුනි රශ්මිකා - 0714816364 සහ තිනේෂා - 0779144798 ඇමතීමෙන් වැඩි විස්තර ලබා ගත හැකි ය. එමෙන් ම පෙබරවාරි 14 දින ප.ව. 1.30 සිට 4.30 අතර ෆොස්ටර් පටුමගේ පිහිටි මහාබෝධි විද්‍යාලයට හෝ සතියේ දිනවල යුනියන් පෙදෙසේ සලාකා ඉදිරිපිට පිහිටි Digital Exposure වර්ණ රසායනාගාරයට ඡායාරූප බාරදිය හැකි ය.


ශ්‍රී ලංකා ජාතික ඡායාරූප කලා සංගමය

තැ.පෙ. 452, කොළඹ

## පංති භාර ආචාර්යවරු

අප සංගමයේ තුන් අවුරුදු ඡායාරූප ශිල්ප ඩිප්ලෝමා පාඨමාලාවේ 2010 වසරේ පංතිභාර උපදේශකවරු වශයෙන් ද පහත නම් සඳහන් විද්වතුන් පත් කරනු ලැබ ඇත. ඒ ඒ පංති සම්බන්ධ සියලු විධි විධාන ඔවුන් විසින් සැලසුම් කරන අතර ගරු අධ්‍යාපන අධ්‍යක්ෂවරයාගේ සම්පූර්ණ වගකීම යටතේ පාඨමාලාව පැවැත්වේ.

පළමු වසර භාර උපදේශක : ශාන්ත ගුණරත්න මහතා (0777519679/0714424895)

දෙවන වසර භාර උපදේශක : රෝහිත එල්. ගුණවර්ධන මහතා (0714400862)

තෙවන වසර භාර උපදේශක : එස්. ඩී. පියදාස මහතා (0774041937)

## Studio Naradha කොහුවල දී විවෘත වේ

මංගල ඡායාරූප ක්ෂේත්‍රයේ නම් දැරූ ප්‍රවීණයකු, සම්මානලාභී ඡායාරූප කලාවේදියකු මෙන් ම අප සංගමයේ අධ්‍යක්ෂවරයකු ද වන නාරද අමරතුංග ආරච්චි මහතා තම නව ව්‍යාපාරික ස්ථානය පෙබ. 01 වැනි දින කොහුවල දී ඡායාරූප කලා ක්ෂේත්‍රයේ විශාල පිරිසකගේ සහභාගිත්වයෙන් යුතුව විවෘත කළේ ය. කොහුවල මංසන්ධියට නුදුරින්, කොළඹ පාරේ බර්නාර්ඩ්ස් ආයතනයට ඉදිරිපසින් පිහිටා ඇති මෙම නව චිත්‍රාගාරය සියලු ආකාරයේ ඡායාරූප ශිල්ප සේවා සහ ද්‍රව්‍ය සැපයුම් මධ්‍යස්ථානයක් වශයෙන් කටයුතු කරනු ඇති බව ඒ මහතා පිළිසඳරට පැවසීය. නාරද අමරතුංග ආරච්චි මහතාගේ නව ඇරඹුමට සංගමයේ සියලු දෙනාගේ ම ආශිර්වාදය පිරිනමමු.

## නව වසරේ මාසික තරග

2010 වසරේ පාඨමාලා විද්‍යාර්ථීන්ගේ නිර්මාණශීලී පරිශ්‍රමයේ දිරිගැන්වීම සඳහා ඊට මග පෙන්වීම උදෙසා සංවිධානය කෙරෙන මාසික ඡායාරූප ශිල්ප තරග පෙබරවාරි මස 28 වැනි දින පටන් ආරම්භ වේ. මෙහි දී ප්‍රථම, දෙවන හා තෙවන වසරවල ඡායාරූප තරග ද අවසන සමස්ත ඡායාරූප ඇගයීම, විචාරය සහ ත්‍යාග ප්‍රදානය ද සිදු කරනු ලබයි. මෙම ව්‍යාපෘතිය සඳහා අනුග්‍රාහක දායකත්වයන් සපයා දෙන මෙන් ගරු අධ්‍යාපන අධ්‍යක්ෂවරයා ඔබට ආරාධනා කරයි.

## Studio CS බෝකුන්දර දී විවෘත වේ

අප සංගමයේ සාමාජිකයකු වන අනුරාධ සංදීපික මහතා (0714821889) තම නව චිත්‍රාගාරය Studio CS නමින් අංක: 201, කොළඹ පාර, බෝකුන්දර, පිළියන්දල යන ස්ථානයේ දී පසුගිය දා විවෘත කළේ ය. ඔහුට සංගමයේ සියලු දෙනාගේ ම සුබ පැතුම් පිරිනමමු.


Nikon FM2 කැමරාව සමග 35-70mm කාචය, 2X Teleconverterය සහ UV පෙරණය විකිණීමට.
විමසන්න: J.P. ද අල්විස් මහතා 0714497546


## වජ්‍ර ජයන්ති සංවත්සර සුහද හමුව මාර්තු 20 වැනිදා

සංගමයේ සහෘද පිරිස් අතර සුහදතාව වර්ධනය කිරීමේ ද්වි වාර්ෂික සුහද හමුව මාර්තු 20 වැනි දා හංවැල්ල "අම්බලම" නිවාඩු නිකේතනයේ දී පැවැත්වීමට විධි විධාන යොදා ඇත. මෙම සුහද හමුව 21 දා නාරාහේන්පිට දී පැවැත්වීමට මුලින් සැලසුම් කරනු ලැබුවද, සාමාජික ඔබගේ වැඩි සුව පහසුව සලකා මෙය මාර්තු 20 දිනට කල් තබන ලදී.

සැම දෙනාට ම සුහදව හමුවිය හැකි "අම්බලම" නිස්කලංක පරිසරය මේ සඳහා ඔබ වෙනුවෙන් අපි තෝරා ගතිමු. ක්‍රීඩා කිරීමේ ක්‍රීඩා පිටි පහසුකම, ස්නානය කිරීමට පිහිනුම් තටාකය, දවල්, සවස ප්‍රණීත ආහාරපාන සැපයුම ආදී විශේෂ පහසුකම් මෙදින ඔබ වෙනුවෙන් සපයනු ලැබේ. ඉහත කී සියලු සේවාවන්, වැඩිහිටියෙකුට රු. 700/ ක් ද අවු. 12 න් පහළ දරුවෙකුට රු. 400/ ක් ද වන මුදලකට සපයා දීමට සැලසුම් කොට ඇත.

කලකට පසු එළඹෙන සුහද පිළිසඳර සඳහා ඔබට ද, පවුලේ සැමට ද දයාවෙන් ආරාධනා කර සිටිමු. සහභාගි වන සැම පවුලකට ම සංගමයේ 60 වන සංවත්සර සමරු තිළිණයක් ද විශේෂයෙන් පිරිනැමේ.

එළඹෙන වජ්‍ර ජයන්ති සැමරුම අළලා වඩාත් උත්කර්ෂවත් වූත්, අප සැම අතර නිරන්තර බැඳියාව හා සුහදතාව වර්ධනය කරන්නා වූත්, සෙනෙහසින් සපිරි දයාබරිත හෝරා කිහිපයක් ගත කරන්නට එක් වෙමු. ඔබගේ පැමිණීම පහත පළවන කූපනය පුරවා අදාළ බරපැන ද සමග සමාජ සේවා අධ්‍යක්ෂ කේ. ජී. කීර්තිරත්න මහතාට (0715333318), ශ්‍යාමලී කරුණාපාල මහත්මියට (0112233624 /07185184954), හෝ චම්පා කුරුප්පු මෙණෙවියට (0774698122) භාර කරන්න.

## වජ්‍ර ජයන්ති සුහද හමුව 2010
## සහභාගිත්වය තහවුරු කිරීම.

සාමාජික මහතාගේ නම :

ලිපිනය :

සාමාජික අංකය :

දුරකථන අංකය :

සහභාගි වන සංඛ්‍යාව : වැඩිහිටි ☐ ළමා ☐

නියමිත මුදල : රු.................................මේ සමග ඉදිරිපත් කරන අතර වජ්‍ර ජයන්ති සුහද හමුව සඳහා මගේ/අපේ සහභාගිත්වය මෙයින් තහවුරු කරමි.

දිනය : ....................................  අත්සන : ..............................................

ශ්‍රී ලංකා ජාතික ඡායාරූප කලා සංගමය
**The National Photographic Art Society of Sri Lanka**

# සංගමයේ සාමාජිකත්වය පිරිනැමීම සඳහා අදාළ නිර්ණායක

## සාමාජිකත්වය අයදුම් කිරීම

සෑම ලිත් වර්ෂයක ම නිශ්චිත කාල වකවානුවක ප්‍රසිද්ධ දැන්වීම් මගින් සාමාජිකත්වය ලබාගැනීමට අවකාශ සැලැස්වීම අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම වේ. ඒ අනුව ශ්‍රී ලංකා ජාතික ඡායාරූප කලා සංගමය මගින් නිකුත් කරන සාමාජික අයදුම්පතක් පුරවා අදාළ සුදුසුකම් සම්පූර්ණ කරන ඕනෑ ම ශ්‍රී ලාංකික හෝ විදේශීය පුරවැසියෙකුට සාමාජිකත්වය අයදුම් කළ හැකි ය.

## සාමාජිකත්වය ලැබීම

සාමාජික අයදුම්පත්‍රයේ ඇතුළත් සඳහනට අනුව ජ්‍යෙෂ්ඨ සාමාජික භවතෙකුගේ නිර්දේශ සලකා බලා, සම්මුඛ පරීක්ෂණයකින් පසු සාමාජිකත්වය ප්‍රදානය කෙරේ. කවර හෝ සාධාරණ හේතුවක් පවතී නම්, අයදුම්කරුට හේතු දැක්වීමකින් තොරව සාමාජිකත්ව අයදුම්පත ප්‍රතික්ෂේප කිරීමේ පූර්ණ අයිතිය සංගමය සතු වේ.

## සාමාජිකත්වය

ව්‍යවස්ථාවේ සඳහන් කොන්දේසිවලට යටත් වන පරිදි සාමාජිකත්ව ප්‍රභේදවලට අනුව සාමාජිකත්වය ප්‍රදානය කෙරේ. සාමාජිකත්ව පිරිනැමීම සම්බන්ධ වගකීම විධායක අධ්‍යක්ෂවරයාට පැවරේ.

1. සාමාජිකත්වය - Membership

විධායක අධ්‍යක්ෂවරයා සහ/හෝ ලේඛකාධිකාරීවරයාගේ වගකීම යටතේ පත්කරනු ලබන සම්මුඛ පරීක්ෂණ කමිටුවක නිර්දේශ පරිදි ප්‍රදානය කරනු ලබයි.

2. පාසැල් සාමාජිකත්වය - Student Membership

පාසැල් සිසුන් විදුහල්පතිතුමන්ගේ අනුමැතියට යටත් ව කරනු ලබන ඉල්ලීම් සලකා බලා ප්‍රදානය කරනු ලබන්නකි.

3. යාවජීව සාමාජිකත්වය - Life Membership

අඛණ්ඩව වසර 05 ක සාමාජිකත්වයක් සම්පූර්ණ කිරීමෙන් පසු, අදාළ සාමාජිකයා විසින් විධායක අධ්‍යක්ෂවරයා වෙතින් කරනු ලබන ලිඛිත ඉල්ලීමකට අනුව අධ්‍යක්ෂ මණ්ඩලයේ ඒකමතික තීන්දුවකට යටත් ව පිරිනමනු ලබන්නකි.

4. ගරු සාමාජිකත්වය - Honorary Membership

සංගමය වෙනුවෙන් කරන ලද සේවාව සැලකිල්ලට ගෙන ගරු අධ්‍යක්ෂ මණ්ඩලයේ යෝජනා ස්ථිරත්වයෙන් සහ ඒකමතිකත්‍වයෙන් ප්‍රදානය කරනු ලබන්නකි.

5. ගරු සහාගී සාමාජිකත්වය - Hon. FNPAS

සංගමයේ, ඡායාරූප ශිල්පයේ හෝ දේශීය හෝ විදේශීය කලා ක්ෂේත්‍රය සඳහා කරනු ලැබ ඇති සේවාව සැලකිල්ලට ගෙන ගරු අධ්‍යක්ෂ මණ්ඩලයේ යෝජනා ස්ථිරත්වයෙන් සහ ඒකමතිකත්‍වයෙන් ප්‍රදානය කරනු ලබන්නකි.

6. අධ්‍යයන කාර්ය හා කුසලතා ඇගයීම් මත පිරිනැමෙන සාමාජිකත්ව.

මේවා ලේඛකාධිකාරීවරයා විසින් පත්කරනු ලබන ඇගයීම් මණ්ඩලයක නිර්දේශය පරිදි වාර්ෂික ව පිරිනැමේ. මෙකී සම්මාන පිළිබඳ වගකීම, පරිපාලන වශයෙන් විධායක අධ්‍යක්ෂවරයාට, ලේඛකාධිකාරීවරයාට මෙන් ම අධ්‍යාපන අධ්‍යක්ෂවරයාට ද පැවරේ.

6.1. ඇසුරු සාමාජිකත්වය - ANPAS

පහත සඳහන් මූලික සුදුසුකම් සපුරාලීමෙන් සහ පරීක්ෂණ මණ්ඩලයේ වාර්තාව පදනම් කොටගෙන පිරිනමනු ලැබේ.

(අ) ශ්‍රී ලංකා ජාතික ඡායාරූප කලා සංගමයේ සාමාජිකයෙකු වීම
සහ,

(ආ) සංගමය මගින් පවත්වන ඩිප්ලෝමා පරීක්ෂණය සමත් වී වසරක් ගත වී තිබීම.
හෝ,

(ඇ) සංගමය විසින් පිළිගනු ලබන ජාත්‍යන්තර ඡායාරූප ප්‍රදර්ශන 10 ක අවම වශයෙන් තම නිර්මාණ 05 ක් ප්‍රදර්ශනය වී තිබීම,
හෝ,

(ඈ) පිළිගත් විශ්වවිද්‍යාලයකින් ඡායාරූප ශිල්පය ප්‍රායෝගික විෂයයක් ලෙස හදාරා පංති සාමර්ථ්‍යයක් සහිත ව ශාස්ත්‍රවේදී, සාමාන්‍ය හෝ විශේෂ උපාධියක් ලබා තිබීම.
සහ,

(ඉ) සංගමය විසින් කාලානුරූපව නියම කරනු ලබන පරිදි නිර්මාණ සහ අනිකුත් දේ පරීක්ෂක මණ්ඩලය හමුවේ ඉදිරිපත් කළ යුතු ය. අදාළ පරීක්ෂක මණ්ඩලයට සෑහීමකට පත්විය හැකි මට්ටමේ වාචික පරීක්ෂණයකට මුහුණ දිය යුතු ය.

6.2. සහාගී සාමාජිකත්වය - FNPAS

පහත සඳහන් මූලික සුදුසුකම් සපුරාලීමෙන් සහ පරීක්ෂණ මණ්ඩලයේ වාර්තාව පදනම් කොටගෙන පිරිනමනු ලැබේ.

(අ) ශ්‍රී ලංකා ජාතික ඡායාරූප කලා සංගමයේ සාමාජිකයෙකු වීම
සහ,

(ආ) ඇසුරු සමාජිකත්වය (ANPAS) ලබාගෙන දෙවසරක් ගත වී තිබීම සහ එම කාලය තුළ ප්‍රමාණවත් තරම් මාධ්‍ය ක්‍රියාකාරකම්හි නිරත වී තිබීම,
සහ,

(ඉ) සංගමය විසින් කාලානුරූපව නියම කරනු ලබන පරිදි ඒක පුද්ගල ප්‍රදර්ශනයක් ඉදිරිපත් කළ යුතු ය.

ඉහත 6.1 සහ 6.2 හි සඳහන් සම්මාන භාවිත කිරීමේ අයිතිය පවතිනුයේ සංගමයේ සාමාජිකත්වය පවත්වාගෙන යන තාක් පමණි.

## සාමාජික යුතුකම් සහ වගකීම්

1. නියමිත නිලවර්ෂය සඳහා මහා සභා රැස්වීමේ දී අනුමත, තම සාමාජිකත්වයට අදාළ ගාස්තු එකී නිල වර්ෂය ඉක්මයාමට ප්‍රථම සංගමය වෙත ගෙවීම සාමාජිකයන්ගේ යුතුකම වේ.

2. සංගමයේ ඡායාරූප ශිල්ප පංති ඇතුළුව සාමාජිකයන් සඳහා වන වැඩසටහන්වලට සහභාගී වීම සාමාජිකයන් සතු අයිතියකි. එසේ ම සංගමයේ සුබසාධන ව්‍යාපෘති, වාර්ෂික චාරිකා සහ සම්මන්ත්‍රණ ආදී වැඩසටහන් සඳහා සහභාගී වීම සාමාජිකයන්ගේ යුතුකමකි.
3. සංගමයේ ව්‍යවස්ථාව මගින් හිමි කොට දී ඇති සියලු අයිතීන් භුක්ති විඳීමේ සහ සාමාජිකත්වය අහිමි වීමේ වගන්තිවලට එකඟ වීමේ වගකීම සාමාජිකත්වය සතු වේ.
4. සංගමයේ අධ්‍යක්ෂ මණ්ඩලය මගින් ව්‍යවස්ථාවට අනුකූලව ගනු ලබන සියලු තීන්දු තීරණ හා ක්‍රියාකාරකම් කෙරෙහි සහයෝගය දැක්වීම සාමාජිකත්වයේ වගකීමක් වේ.
5. සංගමයේ අභිවෘද්ධිය පිණිස අධ්‍යක්ෂ මණ්ඩලයට හෝ මහා සභාවට යෝජනා සහ අදහස් ඉදිරිපත් කිරීමේ පූර්ණ අයිතිය සාමාජිකයන් සතු වේ. තව ද එකී අදහස් සම්බන්ධයෙන් සාමාජික බහුතරයකගේ පොදු මතය හා එකඟවීම සහ ඒවා ක්‍රියාවට නැංවීමේ දී උපරිම ලෙස සහයෝගය දැක්වීම ද සාමාජික යුතුකමකි.
6. කිසියම් විනය කටයුත්තක් සම්බන්ධයෙන් අවශ්‍ය නිර්දේශ ඉදිරිපත් කිරීම පිණිස ඊට අදාළව ගරු අධ්‍යක්ෂ මණ්ඩලය විසින් තාවකාලික විනය කමිටු පත්කරනු ලබන අතර, ඒවායේ තීරණ සම්බන්ධයෙන් එකඟ වීමට සාමාජිකත්වය බැඳී සිටී.
7. සංගමය හා සම්බන්ධ බාහිර ආයතනයකට, කණ්ඩායමකට හෝ ජනමාධ්‍යයකට යම් ප්‍රකාශයක් සිදු කිරීමේ දී ඒ පිළිබඳ ගරු අධ්‍යක්ෂ මණ්ඩලය වෙතින් පූර්ව අනුමැතියක් හෝ වාචික එකඟතාව මත ආවරණ අනුමැතියක් ලබාගත යුතු ය.
8. ජාතික හා ජාත්‍යන්තර වශයෙන් පිළිගැනීමක් සහිත සංගමයක් වශයෙන් සාමූහික වත්, පෞද්ගලික වත් එහි ගරුත්වය නිරන්තරයෙන් සුරැකීම සාමාජික යුතුකමකි.

## සාමාජිකත්වය ආරක්ෂා කරගැනීම සහ පවත්වාගෙන යාම

1. තමන් අයිති සාමාජික ප්‍රභේදය අනුව අදාළ ලිත් වර්ෂයට නියමිත සාමාජික මුදල ගෙවා තිබීම සාමාජිකත්‍වය ආරක්ෂා කරගැනීමේ සහ පවත්වාගෙන යාමේ පළමු පියවර වේ.
2. අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය සහිත ව විනය කමිටුවකින් සාමාජික අයිතීන් සීමා කරන ලද අවස්ථාවක් හැරුණු විට අන් සෑම විටක ම සියලු සාමාජිකයන් සඳහා ව්‍යවස්ථාවෙන් ප්‍රතිපාදනය කර ඇති සාමාජික වරප්‍රසාද හිමි වේ.
3. සාමාජික මුදල් නොගෙවා දෙවසරකින් අනතුරුව සාමාජිකත්‍වය අහෝසි කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලයට බලය ඇත. ඒ පිළිබඳව පෞද්ගලික දැනුම්දීමකින් හෝ පොදු නිවේදන මගින් සාමාජිකත්‍වය දැනුවත් කිරීමෙන් පසු එම පියවර ගත යුතු ය.
4. කිසියම් හෝ හේතුවක් මත සාමාජිකත්වය අහිමි වූවෙකුට යළි සාමාජිකත්වය අයදුම් කළ හැකි ය. එකී සාමාජිකත්වය ප්‍රදානය, අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතියට යටත් ව, නව සාමාජිකත්වයක් ලෙස ලබාගත යුතු ය.

### ඇමුණුම I

## සාමාජිකත්‍වය නිර්දේශ කරන සම්මුඛ පරීක්ෂණ කමිටුවේ සාමාජිකයන් සඳහා උපදෙස්

- අයදුම්පතේ සඳහන් නම හා ජාතික හැඳුනුම්පත් අංකය, ජාතික හැඳුනුම්පත්‍රයේ දත්ත අනුව නිවැරදිව ඇත්දැයි බලන්න.
- අයදුම්පතේ මයා/මිය/මෙණෙවිය නිවැරදි ව ඇති දැයි බලන්න.
- ලිපිනය විමසා තාවකාලික ලිපිනයක් නම්, එය ඉවත් කර ස්ථිර ලිපිනය ලියවාගන්න.
- ඔහු/ඇයගේ ක්‍රියාකාරකම් (සමිති සමාගම්) ආදිය සාකච්ඡා කර ඔහු/ඇය හඳුනාගන්න.
- සංගමයේ ජ්‍යෙෂ්ඨ සාමාජිකයකු නිර්දේශ කර ඇත්නම් ඔහු සමග ඇති සම්බන්ධතාව කෙටියෙන් විමසන්න.
- සංගමය සහ එහි පරමාර්ථ පිළිබඳ කෙටි හැඳින්වීමක් කරන්න.
- සම්පූර්ණ කර ආපසු භාරදීම සඳහා යවා ඇති පත්‍රිකාවේ සියලු ම කොටස් පුරවා ඇත් දැයි බලන්න.
- එහි පංතිවලට සහභාගීවීම/සාමාජිකත්වය පමණක් ද යන්න විමසා, එහි පංතිවලට සහභාගීවීම නම් වසර විමසා ඔබගේ නිර්දේශ එහි ලකුණු කර අත්සන් තබන්න.
- සාමාජික අයදුම්පතේ සහ පුරවා ආපසු බාරදීම පිණිස යවා ඇති පත්‍රිකාවේ අත්සන් තබා ඔබේ නිර්දේශ ඉදිරිපත් කරන්න.
- ඔබගේ පෞද්ගලික මතිමතාන්තර ප්‍රකාශ කිරීමෙන් වළකින්න.

### ඇමුණුම II

## ඇසුරු හා සභාගී සම්මාන අයදුම් කිරීමේ සුදුසුකම්

දැනට (2008) වලංගුව පවතින ඇසුරු සාමාජිකත්ව සහ සභාගී සම්මාන සාමාජිකත්ව අයදුම් කිරීමේ මූලික සුදුසුකම් පහත දැක්වේ. මේ සඳහා අයදුම් කරන අය තමන් විසින් සකසන ලද ජීවදත්ත ගොනුවක් සහිතව ලිඛිත අයදුම්පත්‍රයක් ජූනි මස 30 ට ප්‍රථම ගරු විධායක අධ්‍යක්ෂවරයා වෙත යොමු කළ යුතු ය. තමන් විසින් මෙතෙක් ලබා ඇති ඡායාරූප ශිල්පයට අදාළ සියලු ම ශාස්ත්‍රීය සුදුසුකම්වල, තරග ජයග්‍රහණවල සහ අදාළ සමාජ කාර්යයන්හි සහතිකපත් හා ලිපි ලේඛනවල පිටපත් ද එකී අයදුම්පතට අමුණා තිබිය යුතු ය.

01. ඇසුරු සාමාජිකත්වය - Associate ship
    - (අ) අයදුම්කරු සංගමයේ සාමාජිකයෙකු විය යුතු අතර, සංගමය මගින් පවත්වන ඩිප්ලෝමා පරීක්ෂණය සමත් වී වසරක් ගත වී තිබිය යුතු ය.
    - (ආ) සෙ.මී. 30x40 ප්‍රමාණයට වැඩි නොවන හා සෙ.මී. 20x25 ප්‍රමාණයට අඩු නොවන කලුසුදු ඡායාරූප 10 ක් ඉදිරිපත් කළ යුතු ය. මෙයට ආලේඛ්‍ය, භූමි දර්ශන හා මුද්‍රණ උපක්‍රම අඩංගු විය යුතු ය. තමා විශේෂ නිපුණත්වයක් දක්වන අංශයක් ඇත්නම් එම අංශයේ පමණක් ඡායාරූප ඉදිරිපත් කළ හැකි ය.
    - (ඇ) සෙ.මී. 20x25 ප්‍රමාණයට අඩු නොවන වර්ණ ඡායාරූප 10 ක් ඉදිරිපත් කිරීම.
    - (ඈ) වර්ණ විනිවිදක ඉදිරිපත් කිරීම
    - (ඉ) ඉහත (අ), (ආ), හා (ඇ) දැක්වෙන නිර්මාණ ප්‍රදර්ශන මට්ටමේ ඇති බවට පරීක්ෂණ මණ්ඩලය සෑහීමකට පත්විය යුතු ය.
    - (ඊ) ඉහත (අ) සිට (ඇ) දක්වා සුදුසුකම් නොමැති දේශීය හෝ විදේශීය ඡායාරූප ශිල්පීන් තමාගේ ඡායාරූප ජාත්‍යන්තර ඡායාරූප ප්‍රදර්ශන 10 ක ප්‍රදර්ශනය කර ඇති බවට සාධක ඉදිරිපත් කළ යුතු ය.
02. සභාගී සාමාජිකත්වය - Fellowship
    - (අ) ඡායාරූප 50 ට නොඅඩු සංඛ්‍යාවකින් සමන්විත ඒක පුද්ගල ඡායාරූප ප්‍රදර්ශනයක් පැවැත්වීම, මෙයට කලුසුදු ඡායාරූප 25 ක් වත් තිබිය යුතු ය. එහෙත් අපේක්ෂකයාගේ ඉල්ලීම මත ගරු අධ්‍යක්ෂ මණ්ඩලයේ අවසරය පරිදි කිසියම් එක් තේමාවක් හෝ කලුසුදු ඡායාරූප පමණක් ම හෝ වර්ණ ඡායාරූපවලට පමණක් ම හෝ සීමා වූ ප්‍රදර්ශනයක් පැවැත්වීමට ද අවකාශ ඇත. නොඑසේ නම්,
    - (ආ) ඡායාරූප ශිල්පයේ හෝ කිසියම් විෂය ක්ෂේත්‍රයකට අදාළ වූත්, මූලික සෛද්ධාන්තික කරුණුවලට සීමා නොවන්නා වූත්, පර්යේෂණාත්මක මට්ටමේ ග්‍රන්ථයක් ඉදිරිපත් කළ යුතු ය. මේ සඳහා ද අධ්‍යක්ෂ මණ්ඩලයේ පූර්ව අනුමැතිය හා අවසරය අවශ්‍ය වේ.

# හෙන්රිට, ප්‍රියන්තට AFIAP පිරි නැමේ

ලාංකීය ඡායාරූප කලා ක්ෂේත්‍රයේ සම්මානනීය ඡායාරූප කලාවේදීන් දෙපළක් වන හෙන්රි රාජකරුණා මහතා සහ ප්‍රියන්ත අමරසිංහ මහතා ජාත්‍යන්තර ඡායාරූප කලා සම්මේලනය (FIAP) මගින් පිරිනමන Artist FIAP (AFIAP) සම්මානයෙන් පිදුම් ලබති. අප සංගමයේ ජ්‍යෙෂ්ඨ සාමාජික භවතුන් දෙපළක් වන ඒ දෙදෙනා මීට පෙරාතුව ශ්‍රී ලංකා ජාතික ඡායාරූප කලා සංගමය මගින් පිරිනමන ANPAS හා Hon. FNPAS සම්මාන දිනා ඇති අතර දෙස් විදෙස් ඡායාරූප ශිල්ප ජයග්‍රහණ රැසකට උරුමකම් කියති. ඉතා කලාතුරකින් ඡායාරූප ශිල්පියෙකුට හිමිවන ලොව විශිෂ්ටතම ඡායාරූප සම්මානයක් වන AFIAP ලබා ගැනීම සඳහා මාර්ගෝපදේශකත්වය සැපයීමෙන් සහ නිර්දේශ ඉදිරිපත් කිරීමෙන් දායකවීමට ලැබීම සංගමයේ ද මහත් සතුටට හේතුවකි. හෙන්ර රාජකරුණා, ප්‍රියන්ත අමරසිංහ දෙපළට තව චිරාත් කලක් දේශීය ඡායාරූප කලාකෙත අස්වද්දනු සඳහා අපි සුබපැතුම් පිළිගන්වමු.

## K.G. කීර්තිරත්නගේ ඒක පුද්ගල ඡායාරූප ප්‍රදර්ශනය

සංගමයේ ජ්‍යෙෂ්ඨ සාමාජිකයකු මෙන්ම වර්තමාන සමහර සේවා අධ්‍යක්ෂවරයා ද වන K.G. කීර්තිරත්නගේ දෙවන ඒක පුද්ගල ඡායාරූප ප්‍රදර්ශනය ඉදිරියේ දී පැවැත්වීමට කටයුතු සූදානම් කරමින් පවතී.

මින් පෙර 1998 දී තම ප්‍රථම ඒක පුද්ගල ඡායාරූප ප්‍රදර්ශනය පිළිසඳර නමින් පවත්වනු ලැබූ ඔහු මෙවර ඩිජිටල් ක්‍රමයට සකසන ලද නිර්මාණශීලී ඡායාරූප 50 කින් තම ප්‍රදර්ශනය පැවැත්වීමට අදහස් කරයි.

## කැලණි සරසවියේ ඡායාරූප ශිල්ප ඩිප්ලෝමාවට අයදුම්පත් භාරගැනේ

කැලණිය විශ්වවිද්‍යාලයේ, නාට්‍ය හා රංග කලා සහ ප්‍රතිබිම්බ කලා අධ්‍යයන ඒකකය මගින් පවත්වන ඡායාරූප ශිල්ප ඩිප්ලෝමා පාඨමාලාව 2010 මාර්තු මාසයේ ආරම්භ කිරීමට නියමිත ය. මෙම එක් අවුරුදු සති අන්ත ඩිප්ලෝමා පාඨමාලාව ඡායාරූප ශිල්පය පිළිබඳ මූලික න්‍යායාත්මක හැදෑරීම්වලින් සහ ප්‍රායෝගික අභ්‍යාසවලින් සමන්විත වූවකි. ඡායාරූප ශිල්පය මෙන් ම සිනමා සහ රූපවාහිනී ක්ෂේත්‍රයේ දෙස් විදෙස් විද්වතුන් මෙන් ම හසල අත්දැකීම් සහිත වෘත්තීය ශිල්පීන් ද මෙම පාඨමාලාවේ උපදේශනය සඳහා සම්බන්ධ කොටගෙන ඇත. සති අන්ත ඉරුදින පාඨමාලාවක් ලෙස වසරක් පුරා පැවැත්වෙන මෙම අධ්‍යයන ක්‍රියාවලිය 2010 මාර්තු මස ආරම්භ කිරීමට විධිවිධාන යොදා ඇත.

මහජන බැංකුවේ කැලණිය ශාඛාවේ අංක 05510011 0667549 දරන කැලණිය විශ්වවිද්‍යාලයීය ගිණුමට බැරවන සේ මහජන බැංකුවේ ඕනෑම ශාඛාවකට රු. 250/ක මුදලක් ගෙවා ලබාගත් බැංකු රිසිට්පත සමග නම හා ලිපිනය ලියූ රු. 5.00 ක් වටිනා මුද්දර ඇලවූ 9 ං 4 ප්‍රමාණයේ ලියුම් කවරයක් අධ්‍යයන සම්බන්ධීකාරක, ඡායාරූප ශිල්ප ඩිප්ලෝමා පාඨමාලාව, නාට්‍ය හා රංග කලා සහ ප්‍රතිබිම්බ කලා අධ්‍යයන ඒකකය, කැලණිය විශ්වවිද්‍යාලය, කැලණිය වෙත 2010 පෙබරවාරි මස 20 වන දිනට ප්‍රථම එවීමෙන් අයදුම්පත් ලබා ගත හැකි ය.

## කුරුණෑගල ඡායාරූප සංගමයේ 30 වන වාර්ෂික ඡායාරූප තරගය සහ ප්‍රදර්ශනය

කුරුණෑගල ඡායාරූප සංගමය මගින් පවත්වන 30 වන වාර්ෂික ඡායාරූප තරගය සහ ප්‍රදර්ශනය මෙවර 2010 පෙබරවාරි 27, 28 සහ මාර්තු 01 දිනවල කුරුණෑගල YMBA ශාලාවේ දී පැවැත්වීමට කටයුතු යොදා ඇත. මෙවර ප්‍රදර්ශන ලේකම්වරයා ලෙස කටයුතු කරන්නේ උදේනි අල්විස් මහතා ය.

# සාමාජික ජයග්‍රහණ.
# ප්‍රියංකර ගමගේට FIAP රන් පදක්කමක්



ශ්‍රී ලාංකීය ඡායාරූප ශිල්පියකු විසින් ජයග්‍රහණය කරන ලද ඉහලම සම්මානය වන FIAP රන් පදක්කම සහ ඇ.ඩො. 3000ක මුදල් ත්‍යාගය දිනා ගැනීමට අප සංගමයේ සාමාජිකයකු වන ජී. ජී. යූ. ප්‍රියංකර ගමගේ සමත්විය. මේ වන විට සංගමයේ ඩිප්ලෝමා වසර විද්‍යාර්ථියකු ලෙස ඡායාරූප ශිල්පය හදාරන ඔහු විසින් කටාර් රාජ්‍යයේ පවත්වන ලද AL Thani Awards 2009 ඡායාරූප තරගයේ වර්ණ ඡායාරූප අංශයේ ප්‍රථම ස්ථානය සඳහා පිරි නැමෙන FIAP රන් පදක්කම සහ ත්‍යාගය දිනාගෙන ඇති අතර, එම රන් පදක්කම සහ ත්‍යාගය රැගෙන පසුගිය ජනවාරි මස 17 වන දා කටුනායක ගුවන් තොටුපළින් මෙරටට පැමිණෙන අවස්ථාවේ දි විශේෂ අමුත්තන්ගේ පර්යන්තයේ දී (VIP Lounge) ඉතා හරසරින් ඔහුව පිළිගන්නා ලදී. මෙම උත්සවය ඔහු සාමාජිකත්වය දරණ මිගමුව ඡායාරූප ශිල්පීන්ගේ සංගමය විසින් සංවිධානය කර තිබූ අතර ඔහු සාමාජිකත්වය දරණු ලබන අප සංගමය හා හලාවත තෙවන ඇස ඡායාරූප හා ජන මාධ්‍යවේදීන්ගේ සංගමයේ නිලධාරීන්ගේ ද සහභාගිත්වයෙන් සිදු කරන ලදී.

මීට පෙර ද දේශීය හා ජාත්‍යන්තර ඡායාරූප ප්‍රදර්ශන හා තරග රැසක දී පදක්කම්, සම්මාන හා සහතික ද දිනාගෙන ඇති ප්‍රියංකර ගමගේ හට සංගමයේ සියලු දෙනාගේ සුබපැතුම් මෙසේ පිරිනමමු.

## ප්‍රියන්තගේ "සොබා සිත්රුව" වැඩමුළුව

චිත්‍ර ශිල්පයට ඇලුම් කරන අයට සහ ඡායාරූප ශිල්පයේ සුන්දර මානයන් සොයා යන අයට අලුත් අත්දැකීමක් ලෙස චිත්‍ර ශිල්පමය අත්දැකීමක් විඳගැනීමේ අවස්ථාවක් හැටියට 2010 මාර්තු මස 26, 27, 28 සහ 29 දිනවල ගනේවත්ත දැදුරු ඔය ආශ්‍රිතව නේවාසික ප්‍රායෝගික "සොබා සිත්රුව" වැඩමුළුව පැවැත්වේ. ශාස්ත්‍රවේදී ප්‍රියන්ත අබේසුන්දරගේ මූලිකත්වයෙන් පැවැත්වෙන මෙම වැඩමුළුවට ඔහුගෙන් චිත්‍ර ශිල්ප අධ්‍යාපනය ලබන විද්‍යාර්ථීන් සහභාගී වන අතර, ශ්‍රී ලංකා ජාතික ඡායාරූප කලා සංගමයේ සාමාජිකයන්ට ද මෙම වැඩමුළුව සඳහා සහභාගී වීමට අවස්ථාව ඇත.

සහභාගීත්වය සීමිත වන බැවින් මුලින් සම්බන්ධ වන අයට ප්‍රමුඛතාව ලැබේ. බරපැන රු. 3,500/ ක් වන අතර, මාර්තු මස 15 දිනට පෙර විමසන්න. ප්‍රියන්ත අබේසුන්දර 0777 416669, ජනක රංජිත් කුමාර 071 4712551, සුනේත්‍රා සියඹලාගොඩ 071 5348762, රුවිනි දිසානායක 077 2227602.

# ශ්‍රී ලංකා ජාතික ඡායාරූප කලා සංගමයේ වජ්‍ර ජයන්ති සැමරුම් උළෙල

මෙම වැඩසටහන 2010 ඔක්තෝබර් මස කොළඹ ජාතික කලාභවන මුල් කොටගෙන සංවිධානය කිරීමට විධි විධාන සලස්වා ඇත. 15 වන ජාත්‍යන්තර ඡායාරූප ප්‍රදර්ශනය, සංවත්සර සමරු නිකුත් කිරීම, ඡායාරූප ශිල්ප සම්මන්ත්‍රණ, තිළිණ ප්‍රදානය, අධ්‍යාපනික ප්‍රදර්ශනය, ශාස්ත්‍රීය හා සමරු ප්‍රකාශන එළිදැක්වීම, වෙළඳකුටි ප්‍රදර්ශනය ඇතුළු අංග ගණනාවක් මෙම උළෙලට ඇතුළත් වනු ඇත. මේ සියලු කාර්යයන් සඳහා ඔබගේ ශක්තිය, ධෛර්යය, ආශිංසනය, එක් කරලන්නට ගරු අධ්‍යක්ෂ මණ්ඩලය ඇරයුම් කර සිටී.

## 2010 වජ්‍ර ජයන්ති වැඩසටහන් කමිටුව

| කමිටුව | සම්බන්ධීකාරක | ඇමතුම |
|---|---|---|
| 1. ප්‍රදර්ශන කමිටුව | එන්.ආර්. අභයසිංහ මහතා | 0777 688879 |
| 2. ප්‍රකාශන කමිටුව | විජය බස්නායක මහතා | 071 8229204 |
| 3. මූල්‍ය කමිටුව | සුනිල් ලියනගේ මහතා | 077 2614360 |
| 4. ප්‍රචාරක කමිටුව | උදේනි අල්විස් මහතා | 0777 751819 |
| 5. සංග්‍රහ කමිටුව | චම්පා කුරුප්පු මෙණෙවිය | 077 4698122 |
| 6. සාමාජික සහයෝගිතා කමිටුව | ඒ.ඩී. ගුණරත්න මහතා | 071 6390610 |
| 7. උත්සව සංවිධාන කමිටුව | තිලක වෙරළුපිටිය මහතා | 077 3231676 |
| 8. ආරක්ෂක කමිටුව | චායා අබේවර්ධන මහතා | 077 6114700 |
| 9. සැලසුම් කමිටුව | උ.ග. ගුණසේකර | 071 8106680 |
| i. අනුග්‍රාහකත්ව අනුකමිටුව | සුනිල් වික්‍රම මහතා | 071 2726517 |
| ii. සම්මන්ත්‍රණ අනුකමිටුව | චන්ද්‍රසේන පෙරේරා මහතා | 071 4749435 |
| iii. සැරසිලි අනුකමිටුව | කුමාර කරව්දෙණිය මහතා | 071 6144223 |
| iv. ශාලා සැලසුම් අනුකමිටුව | ප්‍රියන්ත අබේසුන්දර මහතා | 0777 416663 |
| v. බැනර් අනුකමිටුව | ජීවනී ශ්‍රියා ප්‍රියන්ති මෙණෙවිය | 071 8183669 |
| vi. වෙළඳ කුටි අනුකමිටුව | සම්පත් පීරිස් මහතා | 071 8202444 |
| vii. අධ්‍යාපනික ප්‍රදර්ශන අනුකමිටුව | වජිර වික්‍රමගේ මහතා | 011 2670790 |
| viii. සම්මාන ප්‍රදාන අනුකමිටුව | සංඛ සම්මාන පෙරේරා මහතා | 077 3485224 |
| ix. සමරු භාණ්ඩ අනුකමිටුව | අශෝක බුද්ධදාස මහතා | 071 4402950 |
| x. පවිත්‍රතා කටයුතු අනුකමිටුව | අශෝක පේමසිරි මහතා | 071 2238411 |
| xi. කාර්යමණ්ඩල කළමණාකරණ අනුකමිටුව | රාහුල පෙරේරා මහතා | 0777 309432 |

මෙයට අමතරව අධ්‍යක්ෂ මණ්ඩලය, ප්‍රධාන සම්බන්ධීකරණ වගකීම ද, මෙහෙයුම් හා ඇගයුම් කටයුතු පිළිබඳ වගකීම ද, ප්‍රගති සමාලෝචන කාර්යය ද ඉටුකරනු ඇත.

සංගමයේ වජ්‍ර ජයන්ති උළෙල 2010 ඔක්තෝබර් මස කොළඹ දී පැවැත්වීමට විධිවිධාන යොදා ඇත. ඊට අදාළ ඉහත අංශවල ක්‍රියාකාරකම් සාර්ථක ලෙස ඉටු කරගැනීමට ඔබගේ නොමසුරු දායකත්වය අත්‍යවශ්‍ය වේ. ඔබට සංගමය වෙනුවෙන් ඉටු කළ හැකි සෑම ආකාරයක ම දායකත්වයන් සඳහා ඉහත සාමාජික භවතුන් අමතා එම සහයෝගය ලබා දෙන්න. කමිටුවේ මී ළඟ හමුවː පෙබ. 21 ප.ව. 2.00 ට මහාබෝධි විදුහලේ දී.

## රූ රස කතිකාව - පෙබ 14 දා

### රූප මාධ්‍යයේ ප්‍රබුද්ධත්වය සොයා යන සංවාදාත්මක සංකථනය

රූ රස කතිකාව මාසික පිළිසඳරෙහි පියවර හතක් මේ වන විට ඉතා සාර්ථකව හමාර කොට ඇත. මෙම වැඩසටහන යටතේ අක්ෂරය, සංකාරා, මධුසමය, සුදු කලු සහ අලු, The Reader, මචං සහ හංසවිලක් යන චිත්‍රපට ප්‍රදර්ශනය සහ ඒ පිළිබඳ සංවාද මේ වන විට පවත්වා තිබේ.

රූ රස කතිකාව මී ළඟ පියවර පෙබ. 14 ඉරු දින සංගම් මූලස්ථානයේ දී පැවැත්වේ. පෙ.ව. 9.00 ට සිනමාවේදී ප්‍රසන්න විතානගේ ගේ මෙහෙයවීමෙන් ඉර මැදියම චිත්‍රපට ප්‍රදර්ශනය සහ සංවාදය එදිනට නියමිතව ඇත. ඒ සඳහා ඔබට මෙයින් ඇරයුම් කෙරේ.

පිළිසඳරට **වෙහෙස මහන්සිය**
ප්‍රකාශන අධ්‍යක්ෂ - ශාන්ත ගුණරත්න
ප්‍රකාශන අනු කමිටුව
ඉන්ද්‍රික රත්නායක
විමල් ප්‍රියශාන්ත
දර්ශනී චතුරිකා

## අපේ ශෝකය

■ සංගමයේ ජ්‍යෙෂ්ඨ සාමාජික බන්දු ගුණරත්න මහතාගේ මෑණියන් වූ නන්දා ගුණරත්න මහත්මිය පසුගිය දා අභාවප්‍රාප්ත වූවා ය. එතුමියගේ අභාවය පිළිබඳ සංගමයේ ශෝකය මෙයින් පළ කර සිටිමු.

■ සංගමයේ ජ්‍යෙෂ්ඨ සාමාජික රවීන්ද්‍ර පුෂ්පකුමාර මහතාගේ මාමණ්ඩිය වූ W.M. අප්පුහාමි මහතා පසුගිය දා අභාවප්‍රාප්ත විය. ඒ පිළිබඳ සංගමයේ ශෝකය මෙයින් පිරිනමමු.

■ සංගමයේ ජ්‍යෙෂ්ඨ සාමාජික කැලුම් කුමාර පෙරේරා මහතාගේ නැන්දණිය වූ ඇසිලින් ගුණතිලක මහත්මිය පසුගිය දා අප අතරින් වෙන් වූවා ය. ඒ පිළිබඳ ශෝකය මෙයින් පිරිනමමු.

■ සංගමයේ සාමාජිකා සුජානි සෙව්වන්දි මෙණෙවියගේ පියා වූ W.L. කමලරත්න මහතා පසුගිය දා අභාවප්‍රාප්ත විය. ඒ පිළිබඳ සංගමයේ ශෝකය මෙයින් පළ කර සිටිමු.

■ සංගමයේ යාවජීව සාමාජික K.K.P.R. ජයකොඩි මහතාගේ බිරිඳ වූ සුනීතා ජයකොඩි මහත්මිය හදිසි අනතුරකින් ජනවාරි 20 වැනි දින අභාවප්‍රාප්ත වූවා ය. ඒ පිළිබඳ සංගමයේ ශෝකය මෙයින් පළ කර සිටිමු.

■ සංගමයේ සාමාජික ජනක ජයසේකර මහතාගේ මෑණියන් වූ ඥාණා ජයසේකර මහත්මිය පසුගිය දා අභාවප්‍රාප්ත වූවා ය. එතුමියගේ අභාවය පිළිබඳ සංගමයේ ශෝකය මෙයින් පළ කර සිටිමු.